## බෞද්ධ භික්ෂූන් වහන්සේගේ සමාජ සහභාගිත්වය කෙබඳුද?

ශාස්ත්‍රපති කොස්වත්තේ අරියවිමල හිමි.

වත්මන් භික්ෂු ජීවිතය මෙතෙක් ඉතිහාසයේ නොවූ තරම් අභියෝගශීලී අවස්ථාවකට මුහුණ පා ඇති බැවින් "බෞද්ධ භික්ෂූන් වහන්සේගේ සමාජ සහභාගිත්වය කෙබඳු ද?" යන්න විශේෂයෙන් සලකා බැලිය යුතුව තිබේ. භික්ෂු ජීවිතයේ මූලික අනන්‍යතාව සිඳලමින් කවර මාදිලියක වුවද සමාජ ව්‍යාපාරයක සහභාගිවීම භික්ෂුත්වයෙන් අනපේක්ෂිත ය. භික්ෂුවට දැරිය හැක්කේ කෙබඳු සමාජ සහභාගිත්වයක් ද යන්න සලකා ගැනීමට පහසු කරවනු පිණිස භාරතීය පැවිදි සම්ප්‍රදයයත් ඒ තුළ බෞද්ධ භික්ෂුව සතු විශේෂත්වයත් ප්‍රස්තාවනා වශයෙන් තේරුම් ගැනීම අවශ්‍යය. එසේම යම් භික්ෂූන් වහන්සේ නමක් සිය භික්ෂුව සතු විශේෂත්වයත් අනන්‍යතාවයත් ගැන සැළකිලිමත් වන්නේ නම් උන්වහන්සේ වත්මන් සමාජය තුළ කවර අපහසුතාවකට මුහුණ පාන්නේද යන්න තේරුම් ගැනීමට ද එය ඉවහල් වනු ඇත.

### බුදු දහම හා ගිහි - පැවිදි සම්බන්ධය.

භාරතීය පැවිදි සම්ප්‍රදය තුළ විනා අන් කිසිදු ආගමික චින්තන සම්ප්‍රදයක පූජකත්වයක් මිස පැවිද්දක් දැකිය නොහැකි ය. එබැවින් භාරතීය පැවිදි සම්ප්‍රදය මානව චින්තනයේ සුවිශේෂ අවස්ථාවක් නියෝජනය කරයි. ඒ චින්තන සම්ප්‍රදය තුළ දක්නට ලැබෙන්නේ ආධ්‍යාත්මික ප්‍රයත්නයකි. ආත්මවාදයෙන් නිදහස් නොවුවද කාම, රූප, අරූප යන සත්ව විෂය දැකීමෙහි ඒ සම්ප්‍රදය සමත් වී තිබේ. නෛරාත්ම්‍ය දර්ශනයෙන් යුතු බුදුදහම යනු ඒ මානව චින්තන ප්‍රයත්නයෙහි අසහාය ජයග්‍රහණයයි. ඒ චින්තන



ප්‍රයත්නයේ ජීවමාන ශාක්ෂිය වන්නේ සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ ය. ඒ චින්තන දායාදය මානව වර්ගයා වෙත බල පෑම මූර්තිමත් කරන්නේ භික්ෂු - භික්ෂුණී, උපාසක - උපාසිකා යන සිව් පිරිස ය.

සාමාන්‍ය සමාජයට ධර්මය ඉගැන්වීම බුදුසමයට පූර්වයෙහි වූ පැවිද්දන් අතින්ද යම් තරමකින් සිදු වී ඇති නමුත් පැවිදිවත් හා ලෞකික චර්යාවන් එකතු කිරීම බුදුරාජාණන් වහන්සේ අතින් තරම් දක්ෂ ලෙස සිදු වී නැත. එබැවින් බුදුසමය අනෙක් පැවිදි සම්ප්‍රදයයන් අභිබවා ඉදිරියට යයි. කාම වස්තූන්ට ඇළුම් කරන සත්වයන්ට විරාගය පිණිස කරන දේශනා නොවැටහෙන බැවින් ගිහි රටාවත් පැවිදි රටාවත් අතර විධිමත් සම්බන්ධතාවයක් ගොඩ නැගීම බුදුරාජාණන් හමුවෙහි පැවති ගැටළුවකි. දහම් මග පටිසෝතගාමී වුවත් සංකේත, ජනශ්‍රැති සාම්ප්‍රදායික අදහස් මගින් දහම් දෙසීමට බුදුරජාණන් වහන්සේට වූයේ විශේෂ හැකියාවකි. එමගින් ශ්‍රාවකයා තුළ ක්‍රමානුකූල මානසික වර්ධනයක් සිදු විය. ගිහි පුද්ගලයින් පවා අර්හත්වයයට පැමිණියේ ඒ නිසා ය. ගිහි පුද්ගලයන් අර්හත්වයට පැමිණි අවස්ථා දක්නට ලැබෙන්නේ කලාතුරකින් වුවත් ගිහි උපාසක-උපාසිකා දෙපක්ෂයම සම්බන්ධයෙන් සෝතාපන්න, සකදාගාමි, අනාගාමි යන අවස්ථා දක්වා අදළ විහරණයත් සද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා යන ගුණයන් කෙරෙහි සිත එළවන ප්‍රමාණයත් ම.නි. නළකපාන සූත්‍රයේ සාකච්ඡා වෙයි.[1] අර්හත්වය දක්වා එම ගුණයන්ගේ වැඩීම සාකච්ඡා කරන්නේ භික්ෂු - භික්ෂුණී දෙපක්ෂය සම්බන්ධයෙන් පමණි. ගිහි ජීවිතයෙන් අනාගාමි අවස්ථාව දක්වා ආධ්‍යාත්මික වර්ධනයක් අපේක්ෂා වන බව එයින් කියැවේ.

මේ අයුරින් සමාජයෙන් වෙන් වූන වනගත තවුස් වත් ක්‍රමයකට සීමා වී තිබූ ආගමික ජීවිතය සමාජ ජීවිතය සමග එක් කළ ආගමික දර්ශනයක් බුදුරජාණන් වහන්සේ අතින් බිහිවීම භාරතීය ආගමික චින්තාවේ වැදගත් වෙනසක් වෙයි. මේ

කාර්යයට ජෛන මහාවීර වැනි ශාස්තෘවරුන්ද අත ගැසුවත් බුදුසමය මෙන් සාර්ථකත්වයක් පළ කළේ නැත. වනගත තවුස් දිවිය සමාජගත පැවිදි දිවියක් බවට පත් කිරීමත්, ආගමික තෘප්තියක් ගැන සිතීමට අවස්ථාව නොලත් සමාජගත පුද්ගලයාට ආගමික පිළිවෙත සිය ජීවිතය තුළින් ක්‍රියාත්මක කරන්නට අවස්ථාව සැලසීමත් නිසා අද දක්වාත් ගිහි - පැවිදි යන අංශ දෙකින් සැදුම් ලත් බෞද්ධ සමාජයක් ගැන සිතන්නට බුදුසමය විසින් මහ සලසනු ලැබ ඇත.

**ගිහි බෞද්ධයා.**

මෙහිදී භික්ෂූන් වහන්සේගේ සමාජ සහභාගිත්වය පිළිබඳව සාකච්ඡා කිරීමට පෙර භික්ෂූන් වහන්සේගේ සැබෑ අනන්‍යතාව සුරක්ෂිත වන්නේ කෙබඳු ගිහි බෞද්ධ පිරිසක් තුළද යන්න පහද ගත යුතු වෙයි. සමාජයේ සියළු සාමාජිකයන්ගෙන්ම භික්ෂුවගේ ශීලමය සුරක්ෂිත භාවය සිදු වේයයි අපේක්ෂා කිරීම වැරදි ය. යම් මනුෂ්‍යයෙකු උපාසක ගුණයන්ගෙන් සමන්විත නම් බෞද්ධයා වන්නේ ඔහු ය. සද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා යනු ඒ උපාසක ගුණයෝ ය. අද ද මෙය කථා කළත් හුදු අරුත් සුන් වදන් ගොඩක් වී තිබේ. එබැවින් කවර ලෙසකින් මේ ගුණ සම්පූර්ණ වන්නේද යන්න වටහා ගත යුතු ය. ශ්‍රද්ධාව නම් තථාගතයන් වහන්සේගේ අවබෝධය තමාටද ලෝ තතු අවබෝධය සඳහා ප්‍රමාණත්වයෙන් ගැනීමයි. (**සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං**)[2]. බුද්ධප්‍රසාදය වන්නේ ධර්මප්‍රසාදය පාදක කොටගෙන බව එයින් පෙනේ. ධර්මය කෙරෙහි ප්‍රාථමික වශයෙන් ඇතිවන නිෂ්ටාව (**ධම්මෙසු නිට්ඨං ගච්ඡති**) එනම් ධර්මප්‍රසාදය නිසා ඒ සත්‍යය ප්‍රකාශ කරන ශාස්තෘන් වහන්සේ කෙරෙහි ප්‍රසාදය ඇති වෙයි. ඒ සමගම "**සත්ථරි පසීදති**" යි සඳහන් කරන්නේ එබැවිනි.[3] සසුන් පිළිවෙතට බැසීම සඳහා ශාස්තෘන් වහන්සේ විසින් ප්‍රකාශිත ධර්ම සත්‍යය ජීවමාන වශයෙන් පිළිබිඹු වන තැනක් සාමාන්‍ය පුද්ගලයා ට අවශ්‍ය ය. සාමාන්‍ය ජනතාවට බණ දේශනා කිරීමේ දී ආනුපුබ්බි කථා වලින් අනතුරුව සාමුක්කංසික දේශනාව පවත්වන්නේද විනේය



ජන පහසුව තකාය.[4] සසර, කර්මය, භවත්‍රය නොදත් සාමාන්‍ය ජනතාවට දහම් මගට බැසීමට පහසුව සලසන්නේ සංඝ රත්නය විද්‍යමාන නම් පමණි. පඤ්ච අභිඤ්ඤා අෂ්ට සමාපත්ති මගින් ඒ පිළිබඳව දත් මහණ බමුණන් සොයා බුදුරජාණන් වහන්සේ වැඩම කළේ ඔවුනට කෙලින්ම හේතු - ඵල විග්‍රහය ඉදිරිපත් කිරීමෙන් ආත්මවාදයෙන් ගලවා ලීම කළ හැකි නිසා ය. එය ඉක්මනින්ම සාමාජික පුද්ගලයාට දහම් මගට බැසීම සඳහා ජීවමාන ශාක්ෂි ගොඩනැගීමක් හෙවත් සංඝ ශාසනය ඇති කිරීමක් වෙයි. තමාටද නිවන් පිළිවෙතට බැසගැනීම පිණිස සංඝරත්නය පූර්ව ආදර්ශයයි ගැනෙන්නේ හෙවත් සහ සරණ යන්නේ එවිට ය.

මේ කරුණු සලකන විට තිසරණයෙහි පිහිටීම සංස්කෘතික දයාදයක් භාරගැනීමක් නොවන බව පෙනේ. ඒ අනුව සැබෑ ලෙස තිසරණයෙහි පිහිටි ගිහි ජනතාවක් අද සිටින්දැයි සැක කළ යුතුව තිබේ. ශ්‍රද්ධාව සමඟ සංයුක්ත වන අනෙක් අංගය නම් **ශීලයයි**. එනම් පඤ්චශීල ප්‍රතිපදවයි.[5] අද පඤ්ච ශීල සදචාරයෙන් සමන්විත පුද්ගලයින් ඉතා අඩු වී තිබෙන්නේ ඉහත කී ලෙස හැඩ ගැසුන ශ්‍රද්ධාවක් නොමැති නිසා ය. "**සුත**" යනු අනෙක් අංගයයි. බුද්ධ වචනයට මැනැවින් සවන් දීමෙන් සුප්‍රවිදිත සම්‍යක් දෘෂ්ටි ඇති බව එයින් කියැවේ. (**දිට්ඨියා සුප්පටිවිද්ධා**)[6]. මෙය ස්වාක්ඛාත ධර්මය ඇසීමෙන් ලබන බහුශ්‍රැත භාවයයි. ඇතැම් සූත්‍රයක මේ අංගය සඳහන් නොකරන්නේද[7]. ධර්මය සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබෙන හැටියට වැඩෙන කරුණක් බැවිනි. සුත සම්පත්තිය තවම සම්පූර්ණ නැතත් බෞද්ධ භාවයට බාධාවක් නොමැති බව එයින් පෙනේ. සුත සම්පත්තිය සම්පූර්ණ වන්නේ සෝතාපන්න භාවයේදී ය. සිව්වැන්න "**චාග**" නම්. එනම් අනෙකාගේ ජීවන අවශ්‍යතා දක හැකිකමක් තිබේ නම් එය ඉටුකරලීමට යොමු වීමයි. මසුරු මලින් තොරව ගෘහ වාසය පැවැත්වීමයි. (**විගත මලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති**)[8]. අවසාන වශයෙන් දක්වෙන්නේ "**පඤ්ඤ**" යන්නයි. ඇතැම්හු මෙය නුවණැති බව යයි ගොඩින් තේරුම් කරති. එහෙත් බුදුරජාණන් වහන්සේ එමගින් අභිප්‍රේත අර්ථය නම් "**උදයත්ථ ගාමිනී පඤ්ඤ**" යන්නයි.[9] ලෝකය නිර්මාණවාදීව හෝ අහේතුකවාදීව නොගෙන අනිත්‍යත්වයෙන් (ප්‍රත්‍යසාපේක්ෂකත්වයෙන්) ගැනීම ය.

මෛත්‍රී ගුණයන් ගිහි ජනතාව තුළ හැඩගැසෙන පරිදි විධිමත් ලෙස දහම් පණිවිඩය බෙදා හැරීම භික්ෂුවගේ මූලික සමාජ කාර්යයයි. එහෙත් තමා තුළ මෛත්‍රී ගුණ නොමැති නම් ඒ පිළිබඳව විධිමත් සන්නිවේදනයක් කෙනෙකුගෙන් අපේක්ෂා කළ නොහැකි ය. ඉහත කී උපාසක ගුණයන්ගෙන් සැදුම් ලත් පුද්ගලයෙකුම පැවිදි බිමට පැමිණිය යුතුව තිබියදී වෙනත් අරමුණු මත සසුනට පැමිණෙන්නන් බුද්ධ කාලයේදී ම දක්නට ලැබුණි. එසේම ධර්ම මාර්ගය අපැහැදිලි වන යුගයක නොයෙකුත් දෙරටු තැනී සසුනට පුද්ගලයින් පිවිසීම සිදු වෙයි. අද ලංකා බුද්ධ ශාසනට පැවිදි සාමාජිකයන් එක් වන්නේ ළමා වයසේ බැවින් පැවිදි බිමට පැමිණීමෙන් අනතුරුව හෝ සද්ධා, සීල, සුත, චාග, පඤ්ඤා යන ගුණයන් විකසිත වීමට අවශ්‍ය නිරෝගී ශික්ෂණ ප්‍රතිපත්තියක් සකසා ගත යුතුව ඇත. එසේ නොවුව හොත් සාමාන්‍ය ජනතාව ඉහත කී උපාසක ගුණයන්ගෙන් සම්පූර්ණ කිරීමට භික්ෂූන් වහන්සේ අසමත් වෙති. කෙසේ වෙතත් අද භික්ෂුවට සම්බන්ධ වීමට ඇති ගිහි සමාජය වැඩි වශයෙන් බෞද්ධකම සංස්කෘතික දායාදයක් වශයෙන් භාරගත්තක් පමණක් නිසා ඒ තුළ ලජ්ජී, ශික්ෂා ගරුක භික්ෂුවකට සිය පැවිදි අනන්‍යතාව රැකගැනීම අසීරු කරුණක් වී තිබේ.

**වත්මන් භික්ෂූන් වහන්සේ සතු ඌණතා කිහිපයක්.**

එම අසීරුතාව කෙබඳුද යන්න පැහැදිලි කිරීම මතුවට කල්තබමින් වත්මන් භික්ෂුව තුළ පැවිදි අනන්‍යතාව පිළිබඳ සැලකිලිමත් බවක් නොමැති වීමට හේතු කවරේදැයි සලකා බැලීම යෝග්‍ය ය. මෙහිදී අප ප්‍රථමයෙන් දැකිය යුත්තේ දර්ශනික හේතුයි. භික්ෂුවක් කවර දර්ශන සම්පත්තියකින් සමන්විත විය යුතුද? භික්ෂූන් වහන්සේ යනු අනිත්‍ය දර්ශනයෙන් සමන්විත වූවෙකු බැවින් අපෝහ චින්තකයෙකි. පුහුදුන් ලෝකයා ද්වයනිඃශ්‍රිත මනසින් යුතු බැවින් ගැටළු අතර මැදි වී සිටින අතර ඉන් නැගී සිටි මනසකින් ලොව දකින්නේ භික්ෂූන් වහන්සේ ය. ඔහු බාහිර ලෝකයා වෙතින් ලෝක ව්‍යවහාරයන් පිළිබඳ නියත අරුත් අපේක්ෂා නොකරයි. ශබ්දර්ථයත් ප්‍රතිභාසයත් අතර වෙනස ඔහු



දනියි. වචන යනු කෙටි කාලීන වටිනාකමක් සමාරෝපිත වූවක් පමණක් බව ඔහු දනියි. එබැවින් "**මම**" යනුවෙන් නියත ධර්මයක් අපේක්ෂා නොකරයි. එසේම ලෝකයේ කර්තෘ - ක්‍රියා ද්වයතාවක් ව්‍යවහාරික වශයෙන් ප්‍රකට වුවත් එවන් ද්වයතාවක් යථා භූත වශයෙන් අපේක්ෂා කළ නොහැකි බවද දනියි. විඳින්නා හා වින්දනය දෙකක් සේ වැටහුනත් පවතින්නේ කර්තෘත්වයකින් තොර ප්‍රත්‍ය සම්බන්ධතාවක් යටතේ ප්‍රකට වන වින්දන මාත්‍රයයි. ලෞකික හැම සිදුවීමකම ඇත්තේ ඒ නිශ්පුද්ගලත්වයයි. මේ ප්‍රඥ සම්පත්තිය ඇති තැන ලෝකය සමුදය නිරෝධ ක්‍රියාකාරිත්වයක් පමණක් බව දකියි. **(උදයත්ථ ගාමිනී පඤ්ඤා)**[10] නූතන භික්ෂූන් වහන්සේ මේ ප්‍රඥව සිය ජීවිතයේදීම ලෝකයේ සමාජගත හා සන්තානගත ගැටළු තේරුම් ගැනීමට අවශ්‍ය විචාරකෘත්‍යය සපුරාලන්නක් බව අමතක කර ඇත.

බුදුදහම ශ්‍රාවකයා හුදු අනුගාමියෙකු නොකරයි. ඒ වෙනුවට දර්ශන සම්පත්තියක් ප්‍රදානය කරයි. මෙහිදී නිදසුනක් ලෙස බුදුදහමේ මූලික සංකල්පයක් වන අනාත්ම වාදය ගනිමු. බුදු දහම "ආත්මයක් ඇත" යන්නත්, "ආත්මයක් නැත" යන්නත් ද්වයනිඃශ්‍රිත තර්ක බුද්ධියෙන් පැනනගින තර්කාභාසයක් බව දනියි. එහෙත් මුලින්ම අනාත්ම වාදයක් ගැන කියන්නේ පුහුදුන් සියළු දෙනා ආත්මවාදීව සිතන බැවින් එහි ග්‍රහණයෙන් මුදවා ගැනීමේ පූර්ව ප්‍රයෝගයක් වශයෙනි. පසුව "ආත්මයක් නැත" යන්නද "ආත්මයක් ඇත." යන්නේ ප්‍රතිවිරුද්ධ ස්ථාවරය බවත්, ආත්මයේ ඇති - නැති බව කථාකරන්නට සිදුවන්නේ ආත්මයක් මූලික වශයෙන් කල්පනය කරන කල්හි බවත් බුදුසමය අවධාරණය කරයි. එබැවින් ආත්ම සංකල්පයම අර්ථ ශූන්‍ය බව දක්නා කල්හි එහි ඇතිබව හා නැතිබව යන සංකල්ප බිහි නොවෙයි. පුද්ගලයා වෙත බුදුසමය පිරිනමන දර්ශන සම්පත්තිය නම් මෙපරිද්දෙන් චින්තන මූලාවන්ගෙන් නැගිට ලෝකය දැකීමට අවශ්‍ය විචාර ශක්තියයි. මේ සත්‍යයන් දැකිය යුත්තේ මතු සංසාරයේ දී යයි අද භික්ෂූන් වහන්සේ සිතති.

මේ ප්‍රඥා සම්පත්තියෙන් තොරව සමාජ කාර්යයෙහි නියුක්ත වීමේදි භික්ෂු අනන්‍යතාව බිඳ වැටෙන ක්‍රියා රටාවන්ට හසු වීම අනෙක් කරුණයි. භික්ෂුවගේ සැබෑ සමාජ කාර්‍යය නම්

කවර සමාජ ව්‍යාපාරයක හෝ නියාමකත්වයට පැමිණීම නොවේ. සමාජ ගත පුද්ගලයාට සමාජ ව්‍යාපාරයේදී තිබිය යුතු නිරෝගී ආකල්පයන් කවරේදැයි විමසා බැලීමට භික්ෂූන් වහන්සේ ලබන්නේ ගිහියාට නැති විවේකයකි. ඒ විවේකයෙන් අවශ්‍ය සමාජ උපදේශය ජනතාවටත් රාජ්‍ය තන්ත්‍රයටත් නිවේදනය කිරීම භික්ෂුවගේ සමාජ කාර්යයයි. පැවිද්දගේ විවේකය (විවික්තභාවය) මදයෙන් ප්‍රමාදයෙන් වෙන්වීමයි. **(මදප්පමාද පටිවිරතා)** ඉවසීමෙහිදීද, සූතර භාවයෙහිද (කායික වාචසික සුචරිතය) පිහිටි අයෙකු වීම අවශ්‍ය ය. **(ඛන්ති සොරච්ච නිවිට්ඨා)** ඉන්ද්‍රිය දමනයෙහි නියුතු **(එකමත්තානං දමෙන්ති)**, ක්ලේශ වූපසමනයෙහි නියුතු **(එකමත්තානං සමෙන්ති)**, ක්ලේශ පරිනිර්වාණයෙහි උත්සුක වූ **(එකමත්තානං පරිනිබ්බාපෙන්ති)**[11]. භික්ෂුවක්ම සමාජ කාර්යයෙහි නියුක්ත විය යුතුයි.

එවන් ගුණයන්ගෙන් සැදුම් ලත් භික්ෂූන් වහන්සේ කෙබඳු සමාජ අවශ්‍යතාවක් ඉටු කරන්නේ ද යන්න චක්කවත්ති සූත්‍රය විවරණය කරයි. ඒ අනුව රජතුමා විසින් කලින් කල පැමිණ දක්ෂතාව කුමක්ද? **(කිං භන්තෙ කුසලං)** අදක්ෂතාව කුමක්ද? **(කිං අකුසලං)** වැරැද්ද කුමක්ද? **(කිං සාවජ්ජං)** නිවැරැද්ද කුමක්ද? **(කිං අනවජ්ජං)** ඇසුරු කළ යුත්තේ කුමක්ද? **(කිං සෙවිතබ්බං)** කුමක් කළ හොත් දිගු කලක් අවැඩ පිණිස පවතීද? **(කිං මෙ කරියමානං දීඝරත්තං. අහිතාය දුක්ඛාය අස්ස)** කුමක් කළහොත් දිගුකලක් වැඩ පිණිස පවතීද? **(කිං වා පන මෙ කරියමානං දීඝරත්තං හිතාය සුඛාය අස්ස)**[12]. යනුවෙන් ප්‍රශ්න කරන විට විධිමත් ලෙස ඒ ප්‍රශ්න විසඳාලීමට අවශ්‍ය විචක්ෂණ භාවය භික්ෂුව සතු විය යුතු ය. සමාජ වසහයට නොගොස් සමාජ කාර්යයෙහි නියුක්ත වීමට භික්ෂූන් වහන්සේට හැකි වන්නේ එවිට ය.

භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය මේ විචක්ෂණ භාවය ඇතිකිරීම අරමුණු කරගත්තක් විය යුතු ය. ඉහත කී සමාජ අවශ්‍යතාව පිරිමසාලීමට අවශ්‍ය විචාර ශක්තිය භික්ෂුව වෙතින් පලා ගොස් ඇත්තේද බෞද්ධභාවය සංස්කෘතික දයාදයක් ලෙස



ගැනීම නිසයි. භික්ෂුත්වය යනු ප්‍රතිපදාවට බැසගැන්මම විනා ඉන් මෙපිට වූවක් නොවන බව සාම්ප්‍රදායික විවිධ අදහස් නිසා අමතකව ගොස් ඇත. ප්‍රතිපදවට නොබැස පැවිදි වෙසින් සිටීම ගිහි භෝගයෙන් පිරිහීමක් පමණි. ශ්‍රමණත්වය නොපුරයි නම් **(සාමඤ්ඤත්ථං න පරිපූරෙති)** ගිහි භෝගහීයෙන්ද පිරිහි සිටියි නම් එය අපවිත්‍ර ජීවන රටාවකට වැටීමක් බව සං.නි. පිණ්ඩොල්‍ය සූත්‍රයෙහි සඳහන් වෙයි. යම් සේ දෙකෙළවර ගිනිගත් මැද අසූචියෙන් තැවරුන දර කැබැල්ලක් වනයෙහි හෝ ගමෙහි හෝ දර සංඛ්‍යාවට නොවැටේද එපරිද්දෙන් පරසන්තකයෙහි ලෝභ සිතින්, වස්තුකාමයන්හි තීව්‍ර වූ රාග ඇතිව **(අභිජ්ඣාලූ කාමෙසු තිබ්බසාරාගො)** ක්‍රියා කරයිද, අනුන් නසන සිතින් දුෂ්ට සිතින් **(අබ්‍යාපන්න චිතෙතා පදුට්ඨ මන සංකපෙපා)** ක්‍රියා කරයිද, එළඹී සිටි සිහියෙන් ක්‍රියා නොකරයිද **(මුට්ඨස්සති)**, සම්ප්‍රජන්‍යයෙන් තොර වෙයිද **(අසම්පජානො)**, ලෝකය ඇති සැටියෙන් නොව අන් අයුරකින් කල්පනය කරයිද **(විබ්භන්ත චිතෙතා)**, නොවැඩූ ඉන්ද්‍රියයන් ඇතිද **(පාකතින්ද්‍රියො)**, එබඳු භික්ෂුව ගිහි - පැවිදි දෙපසින්ම පිරිහුණ අපවිත්‍ර පුද්ගලයෙකු බව දක්වේ.[13] මේ දුර්වලතාවෙන් නැගී සිටීම ශ්‍රමණත්වයේ අවසාන ඵලය නොව ආරම්භයේ දී හැඩ ගැසිය යුතු පිළිවෙළයි. එබැවින් භික්ෂුව සමාජ කාර්යයෙහි නියුක්ත විය යුත්තේ මේ ගුණය විනාශ නොවන ආකාරයෙනි.

මේ අනුව භික්ෂුව සතු විය යුතු ප්‍රඥාසම්පත්තියත්, සදචාර සම්පත්තියත් පැහැදිලි ය. භික්ෂුවගේ අධ්‍යාපනය මේ කාර්යය සඵලකරවන ලෙස සැලසුම් විය යුතු ය, දේශපාලන ක්‍රියාවලිය විසින් කපටි ලෙස භික්ෂුව ග්‍රහනයට හසු කර ගනු ලැබ ඇත්තේ ඒ නිසි අධ්‍යාපනය භික්ෂුවට නොමැති නිසා ය. අද දේශපාලකයෝ භික්ෂුව බලයට පැමිණීම සඳහා හිණිපෙතක් කරගෙන සිටිති. ඕනෑම දේශපාලන වේදිකාවකට භික්ෂුවක් ද නංවා ගනු ලබයි. දේශපාලනය තම අයිතිවාසිකමක් ලෙස සලකන තැන තමා කපටි පුද්ගලයන් විසින් පටු අවශ්‍යතා සඳහා යොදා ගන්නා බව භික්ෂුවට අමතක වෙයි. විවිධ දේශපාලන කඳවුරුවල භික්ෂු වේශයද දක්නට ලැබෙන විට භික්ෂුවගේ පැහැදිලි නියාමක බවක් නොමැති තත්ත්වයට පත්වෙයි.

භික්ෂුවගේ නියත මෙහෙය කුමක්දැයි ජනතාවට පැහැදිලි නොවෙයි. දේශපාලකයාටත්, විවිධ සංවිධාන වලටත් භික්ෂුව මේ තත්ත්වයට පත් කිරීමට අවශ්‍යව තිබේ.

දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන රටා තුළින් ප්‍රමාණවත් පරිදි ඉහත කී ප්‍රඥා සම්පත්තියත්, සදාචාරයත් නොසැලසෙන බව අමතක වෙයි. එහි අවශ්‍යතාවද නොදකියි. එබැවින් අද භික්ෂූන් වහන්සේ දහම් මගට බැසීම වෙනුවට විවිධ දෘෂ්ඨීන් අතර අතරමං වී සිටිති. ශාසනික ආචාර්යවරයාගේ මූලික සුදුසුකම් අතර ශිෂ්‍යයා තුළ ඇති වන දෘෂ්ඨීන් ධර්මානුකූලව විවේචනය කිරීමට හැකියාවක් තිබිය යුතු බව අවධාරණය වෙයි. (**උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං**)[14].

**භික්ෂු ශික්ෂණයට හා සමාජ කෘත්‍යයට ඇති බාධා**.

ඉහත කී දුර්වලතාවන් දිගින් දිගටම පැවතීමට ඉඩ හැරීම භික්ෂුත්වය විධිමත් ලෙස පවත්වාගෙන යාමට අභියෝග බිහිකරයි. නිරනුමානවම භික්ෂූන් වහන්සේ යනු සමාජය විෂයයෙහි යහපත්, නිවැරදි, නිරෝගි බලපෑමක් කරන පුද්ගලයෙකි. සමාජයේ යල් පැන ගිය සමාජ අගයයන් වෙනුවට, සාධාරණත්වය සැළකිල්ලට නොගෙන හැඩගැසෙන අගයයන් වෙනුවට නව අගයයන් ඉදිරිපත් කිරීමට බුදුසමයට ඇති හැකියාව ක්‍රි.පූ. 6 වැනි සියවසට මෙන් ම විසි වැනි සියවසටද සාධාරණ ය. බෞද්ධ අගැයුම් විධිමත් ලෙස සමාජය හා සංස්ලේෂණය කිරිමේ මූලික වගකීම භික්ෂුව මත පැවරෙයි. බුදුසමයේ පහළ වීමත් සමග ලෝකයේ ප්‍රථම වතාවට සමාජ සාධාරණය, රාජ්‍යයේ ධාර්මිකත්වය, මිනිස් සංහතියේ ඒකත්වය, නිෂ්පාදන පරිභෝජන ක්‍රියාවලියේ විධිමත් භාවය, විසම වයඝ්‍රාව වෙනුවට සම වයඝ්‍රාව සාකච්ඡාවට භාජනය වූයේ බුදුසමය තුළයි. එය භාරතීය සමාජයේ සාම්ප්‍රදයික ආකල්පයන් දෙදරා ගිය බලපෑමක් විය. වර්තමානයෙහි ද සමාජ ගත විසමතාවන් ස්වකීය විචාර කෘත්‍යය තුළින් විධිමත් ලෙස තේරුම් ගෙන අවශ්‍ය ප්‍රතිපත්තීන් නිර්දේශ කිරීමේ වගකීම භික්ෂූන් වහන්සේගෙන් වෙන් කොට ලිය නොහැකි ය. අවශ්‍ය නම් එයට දේශපාලනය යයි කිව හැකි ය. එහෙත් අද පවතින



බල තරහය, චරිත ඝාතනය, මැරවර සන්නද්ධ භාවය, දේශපාලන ස්වමතාන්ධ භාවය වැනි අංග වලින් සැදුම් ලත් දේශපාලනය නම් නොවේ. එබැවින් සමාජ වසහයට නොගිය මනසකින් යුතුව සමාජ කාර්යයෙහි භික්ෂූන් වහන්සේ නිරත විය යුතු ය. සමාජයෙහි වසහට පත් සිත සමාජ මෙහෙයෙහි අසමත් බව භික්ෂූන් වහන්සේ තේරුම් ගත යුතු ය.

එහෙත් ඒ උතුම් කාර්යයට භික්ෂුව නුසුදුස්සෙකු කිරීමටත්, සමාජ කායඝීයට බාධා කිරීමටත් ගොඩනැඟුන බලවේග රාශියකි.

1. **භික්ෂූන් වහන්සේ නව දැනුමෙන් හිස් විය යුතුයයි සිතන පිරිසක් බිහි වීම**. (භික්ෂූන් වහන්සේ බෞද්ධ චින්තනය කුළු ගැන්වීමේ දී පැරණි බ්‍රහ්මජාලය (නවීන, විද්‍යා, දර්ශන, ආගම්, දේශපාලන සංකල්ප ආර්ථික සංකල්ප, සමාජ විද්‍යාව ආදිය) පිළිබඳව ද අවබෝධයක් ලැබිය යුතු ය. බෞද්ධ චින්තනය අනිවායඝී වශයෙන් නොදක අනෙක් කවර විෂයයක් කෙරෙහි විශේෂඥයෙකු වුවද නිශ්ප්‍රයෝජනය)

2. **අන්‍යාගමික බලවේග**. (බොහෝ ආගම් ලෝකයේ ව්‍යාප්ත වන්නේ ආක්‍රමණශීලීව ය. ඒ ප්‍රතිපත්තිය බුදුසමයේ ආකල්පයට පටහැනි ය. එනිසා ආක්‍රමණයෙන් තොර චින්තනයක් ලෙස ව්‍යාප්ත වීම අභියෝගයක් කොට සිතන ආගම් බුදු සමය දුර්වල කිරීමෙහි ලා උපක්‍රම යොදති. ලංකාවේ දී මෙය ක්‍රියාත්මක වන ආකාරය ගැන එක් නිදසුනක් පෙන්වමි. බෞද්ධයා සමගියට කැමති නැතැයි තහවුරු කිරීම පිණිස ඇතැම්හු ද්‍රවිඩ ජනතාවට ධර්ම නොකරන්නේ ඇයිද? ඔවුන් පැවිදි නොකරන්නේ ඇයිද? නිවන් දකින්නේ සිංහලයින් පමණක් ද? යනුවෙන් ප්‍රශ්න කරති. මේ සැබෑ තත්ත්වය වසා තබන ප්‍රශ්න කිරීමකි. කවුරුත් තමා අයත් ආගම අදහන්නට කැමති ය. ඒ අනුව හින්දු භක්තිකයා හින්දුවෙකු වශයෙන් සිටීම ගැන බෞද්ධයාට වේදනාවක් නැත. ඉහත දක්වූ ප්‍රශ්නයේ තේරුම නම් බෞද්ධයින් හින්දුන්ව ආගමික වශයෙන් ආක්‍රමණය නොකරන්නේ ඇයි, යන්න නොවේ ද? අනුන්

ආක්‍රමණය නොකිරීමට බෞද්ධයින්ගේ වැරැද්දක් කොට හුවා දක්වීමටත්, තමන්ගේ ආගමික ආක්‍රමණයන් යුක්ති සහගත කර ගැනීමටත් ඇතැම් ආගමික සංවිධාන උත්සාහ ගන්නා බව පෙනේ.)

3. **භික්ෂුවගේ දර්ශන සම්පත්තිය කුමක් ද? යන්න පිළිබඳව වත්මන් භික්ෂූන් වහන්සේ සැලකිලිමත් නොවීම.**

භික්ෂුවට සුවිශේෂ වූ දර්ශනය හඳුනා ගැනීමේ දී භික්ෂුවගේ "**සුත සම්පත්තිය**" පැහැදිලි කර ගත යුතු ය. භික්ෂු ජීවිතයේ "ථෙර කරණ" ධර්ම විවරණය කරන අං.නි. දුතිය උරුවේල සූත්‍රය[15]. භික්ෂුවගේ සුත සම්පත්තිය පැහැදිලි කරයි. ඒ අනුව බ්‍රහ්ම චර්‍යාව ප්‍රකාශ කරන, මුල මැද අග යහපත් වූ ධර්මය අසා දරන්නේ වෙයිද (**සුතධරො**), අසා රැස් කරන්නේ වෙයිද (**සුතසන්නිචයො**), ඒ ධර්මය බොහෝ කොට අසන ලද්දාහු වෙත්ද (**බහුස්සුතා**), දරණ ලද්දාහු වෙත්ද (**ධතා**), වචනයෙන් ප්‍රගුණ කරන ලද්දාහු වෙත්ද (**වචසා පරිචිතා**). සිතින් නැවත නැවතත් අරුත් සලකන ලද්දාහු වෙත්ද (**මනසානුපෙක්ඛිතා**), දැක්මෙන් මැනැවින් ප්‍රතිවිදිත වූවාහු වෙත්ද (**දිට්ඨියා සුප්පටිවිද්ධා**) එපමණකින් භික්ෂුවගේ සුත සම්පත්තිය සම්පූර්ණය. මේ සුත සම්පත්තිය සලසා ලීම අරමුණු කර නොගත් භික්ෂු අධ්‍යාපන රටාවකින් පලක් නැත.

ශාසන භාරධාරී ගෞරවණීය නායක කාරකාදී මහා සංඝ රත්නයේ අවධානය මේ තත්ත්වය කෙරෙහි නොපමාව යොමු විය යුතුයි. මේ සුත සම්පත්තිය භික්ෂූන් වහන්සේලා වෙත ප්‍රදානය කිරීම උන්වහන්සේලා වෙත සද්ධා, සීල, චාග, පඤ්ඤා යන සම්පත් ප්‍රදානය කිරීමක් ද වෙයි.

එලෙස නොවුව හොත් අනාගතයේ දී භික්ෂූන් වහන්සේලාද වෘත්තීය අයිතිවාසිකම් සඳහා සටන් වදින වෘත්තීය සමිතිකරුවන් වීම නොවැලැක්විය හැකි වනු ඇත. පිරිවෙන් සඳහා දෙන රජයේ ආධාර හා වැටුප් අත්හිටුවීම ද භික්ෂුව ඒ පිරිහීමට ඇදදැමීමට අවස්ථාව සැලසීමකි. එබැවින් ගෞරවණීය මහා සංඝයා



වහන්සේ වෙත මා කරන ආයාචනය නම් ශාසනික දේපල විධිමත් ව රජයේ ආයතන ක්‍රමයෙන් ඉවත්ව භික්ෂු අධ්‍යාපනය පවත්වා ගත යුතුය යන්නයි.

ඒ අධ්‍යාපනය භික්ෂූන් වහන්සේ නූතන සමාජ විඤ්ඤාණයට දහැමි බලපෑමක් කළ හැකි පුද්ගලයෙකු වන ආකාරයෙනුත්, ධර්මයෙහි හසළ පුද්ගලයෙකු වන ආකාරයෙනුත්, සද්ධා සීලාදී ගුණයන් විකසිත කළ පුද්ගලයෙකු වන ආකාරයෙනුත් සකස් කර ලීමට වහ වහා කටයුතු සම්පාදනය කළ යුතු ය. මේ කාර්යය ඉටු කළ යුත්තේ තමතමන්ගේ මානසික ලෝක වලින් එළියට පැමිණ අව්‍යාජ ශාසනික පරිත්‍යාගයකින් බැවින් ඒ සඳහා කවරෙකු සුදුසුද යන්න මෙහිදී පැනනගින බරපතල ගැටළුවයි. ශාසනික කාර්යය නැවත විධිමත් කිරීමේ දී ඒ කාර්යය ආරම්භ කළ යුත්තේ බාහිර සැලසුම්වලින් නොව බුදුරජාණන් වහන්සේ නිර්දේශ කළ ප්‍රතිපදවේ සිට බව අවධාරණයෙන් ප්‍රකාශ කළ යුතු ය. මේ තත්ත්වය පවතින්නට හැරීම භික්ෂූන් වහන්සේ ප්‍රාදේශීය දේවගැති වරයෙකුට සමාන කිරීමට අවස්ථාව සලසා දීමකි. (The bhikkhu today is not unlike a 'parish minister'.)[16]

එසේම ශීලයේ වැඩීම පුද්ගලයා විමුක්තිය වෙත මෙහෙයවන "උතුම් පිළිවෙතෙහි" ප්‍රථම පියවර වන නමුත් ඒ සෘජු කාර්‍යයෙහි වැදගත්කම දන් ස්ථිරව නොපිළිගන්නා තැනට වැටී ඇති බව (The significance of the 'derect role' appears now to have no firm recognition, although moral advancement, significantly, also forms the first step in an individual's 'upward way' to transcendence.)[17]. ගිහි පින්වතුන් විසින් මතක් කර දෙනු ලබන කල්හිත් පිරිහීමේ මාවතෙන් වෙනස් වීමට භික්ෂූන් වහන්සේ කල්පනා කර නැත.

4. **භික්ෂු ජීවිතයේ අනන්‍යතාව සුරක්ෂිත වන පරිදි ශාසනික ජීවිතයක් පවත්වාගෙන යාමට සුදුසු සද්ධා. සීල. සුත. චාග. පඤ්ඤා. යන ගුණාංගයන්ගෙන් සැදුම් ලත් ගිහි උපාසක උපාසිකා පිරිසක් අඩු වීම.** (මේ දුර්වලතාවට ප්‍රධාන හේතුව වනුයේ භික්ෂූන් වහන්සේ සද්ධා, සීල, සුත, චාග,

පසද්ධා යන ගුණයන්ගෙන් සමන්විතව ඒ ගුණ ගිහි ජනතාව තුළ විකසිත වන ආකාරයට ධර්මය පැහැදිලි නොකිරීමයි. ම.නි., නළකපාන සූත්‍රයෙහි ගිහි පැවිදි දෙපක්ෂයටම එකී ගුණ සාධාරණ බව කියැවෙයි. තුන් වැනි අංකය යටතේ කළ විවරණය අනුව භික්ෂූන් වහන්සේ ක්‍රියාත්මක නොවූවහොත් ඕනෑම මාදිලියේ සටනක පෙරමුණට උන්වහන්සේ පැමිණිය යුතුයයි තවදුරටත් මිනිසුන් අපේක්ෂා කළ හැකියි. එහි අවසාන ප්‍රතිඵලය නම් භික්ෂූන් වහන්සේට කරන්නට ඇති උසස්ම සමාජ මෙහෙය ඉටුකිරීමට නොසුදුසු පුද්ගලයෙකු වශයෙන් ලෝකයා කල්පනා කිරීම ය. දැනටමත් ඒ අපකීර්තියට මුහුණ දීමට භික්ෂූන් වහන්සේට සිදු වී ඇත.

සමාජ අරගලයට භික්ෂුව නොපැමිණෙන කල්හි මනුෂ්‍යයා **ඇයි මේව ගැන හාමුදුරුවරු නිස්සද්ද?**. යි අසති. අරගලයට සහභාගි වූ කල්හි "ඕකද මහණකම" යි අසති. භික්ෂුව පිළිබඳ විධිමත් අනන්‍යතාවක් ප්‍රකටවන පරිදි ධර්මානුකූල අවබෝධයක් ශාසනික අධ්‍යාපනයක් තුළින් නොලබන භික්ෂුව මේ ප්‍රශ්නකිරීම් වලට මැදි වෙයි. සමහරු අරගලය තෝරා ගනිති. සමහරු පවත්නා දේශපාලන බලවේගවලට හේත්තු වී සිටිති. ලජ්ජී භික්ෂුවට මේ දෙකම කළ නොහැකි ය. එහෙත් ඒවා අද ගැනෙන්නේ සාමාන්‍ය දේ හැටියට ය. එසේම නූතන සමාජ සංස්ථාව සැබෑ භික්ෂු ජීවිතයේ දී සම්පත් විනාශ කිරීම්, සොරකම් කිරීම්, මිනී මැරීම් වැනි ක්‍රියා පිළිබඳ නීතිමය ප්‍රශ්නකිරීම් වලට පිළිතුරු දීමටත්, තවෙකෙකු නීතියේ රැහැනට හසු කර දීමටත් කිසිදු ඉඩක් නොමැති බව හා එය පැවිද්දෙන් පිරිහීමට (පාරාජිකා වීමට) හේතු වන දේ බවත් නොදනියි. එවන් සමාජයක් තුළ පැවිදි ජීවිතයක් ගත කිරීම අතිශයින් අභියෝගශීලි වූවකි.)

5. **දේශපාලකයා සියුම් ලෙස භික්ෂූන් වහන්සේ මහජන අවධානය ලබා ගැනීම පිණිස උපයෝගී කර ගැනීම**. දේශපාලන අපේක්ෂා ඉදිරියේ ප්‍රව්‍රජිත ජීවිතයක වටිනාකම දේශපාලකයා



නොදකියි. ලාභය, කීර්තිය ආදිය ඉදිරියේ භික්ෂූන් වහන්සේට ද එය අමතක වෙයි. මෙහි ඇති විනාශකාරී බව ලාංකික භික්ෂූන් වහන්සේ හා ගිහි පක්ෂය අතීතයේ තේරුම් ගෙන ක්‍රියා කළ බව කුරුණෑගල යුගයේ ලියැවුන ජාතක පොතින් පැහැදිලි වෙයි. චුල්ලනාරද ජාතකයේ බෝසත් සෘෂිවරයා සිය පුත් නාරද සෘෂිවරයාට වනවිහරණයෙන් ඉවත්වී ජනපද වාසයට යනු කැමැති බව ප්‍රකාශ කළ අවස්ථාවේ දී එසේ නම් ජනපද චාරිත්‍රය දනුවයි කළ අනුශාසනයෙහි එය සඳහන් වෙයි. "ලාභය, කීර්තිය, සත්කාරය, පූජාය යන මෙතෙක් ඇත්නම් මේ තෙම බ්‍රහ්මචර්‍ය්‍යාවට මඩෙකැයි කියන ලද."[18] යනුයි ඒ සමාජ කාර්යයෙහි නියුක්ත වන භික්ෂුව විසින් ලෞකික ලාභයක් පිළිබඳව දැරිය යුතු ආකල්පය එයින් කියැවේ.

එසේම දේශපාලකයන් සමග සම්බන්ධ වීමේ අනර්ථය ඒ ජනපද චාරිත්‍රය පිළිබඳ විස්තරයේදීම මෙසේ සඳහන් වේ. තවද පුත නාරද නම් තපස්විනි, මේ පෘථිවි මණ්ඩලයෙහි මහත් වූ යස පිරිවර ඇතිව මහත් වූ තේජස් ඇති රජදරුවෝ රාජ්‍ය ශ්‍රී අනුභව කෙරෙමින් වෙසෙති. එබඳු වූ ආශ්චර්‍ය්‍යයෙන් හා අධිපති භාවයෙන් යුක්ත රජදරුවන් සමීපයේ රජ කුළුපගව නොවසව. බ්‍රහ්මචර්‍ය්‍යාව කරන්නාවුන්ට ඒ රජ දරුවෝ නම් සර්පයන් හා සමානයෝ ය.[19] තතු මෙසේ බැවින් භික්ෂූන් වහන්සේ තම අනන්‍යතාව රැක ගනිමින් භික්ෂුවට අදාළ දර්ශන සම්පත්තියෙන් ද යුතුව සමාජ කාර්යයෙහි නියුක්ත විය යුතු ය. එහිදී භික්ෂුව දේශපාලකයාගේ අභිමතයට ක්‍රියා නොකරන නමුත් ප්‍රහාරයෙන් මර්දනය කළ නොහැකි ය. ලෞකික සංග්‍රහයෙන් මුළු ගන්වා තැබිය නොහැකි ද වේ. අද ප්‍රහාරය හා සංග්‍රහය මර්දන උපක්‍රම දෙකක් ලෙස භාවිත වෙයි.)

6. **සන්නිවේදන දුර්වලතාව**. (නූතන සමාජයේ වාණිජ ලෝකය මිනිස් ආවේගයන් මැනැවින් හදරා, මිනිස් අවශ්‍යතාවක් ලෙස වැදගත් නොවන දේ ගැන පවා සියුම් ලෙස සන්නිවේදන උපක්‍රම මගින් මිනිස් සිත තුළ දැඩි අවශ්‍යතාවක් ඇති කර වාණිජ්‍ය කටයුතු ලාභදායක ව්‍යාපාර බවට පත් කරගෙන තිබේ. මිනිස් රුචිය ප්‍රබල

ලෙස එම උපක්‍රම මගින් පැහැරගත් යුගයක (බුදුරජාණන් වහන්සේ ද කළාක් මෙන්) මිනිසාට වඩාත් සමීප වන ලෙස ධර්මය පිළිබඳ විධිමත් සන්නිවේදනයක් සිදු විය යුතුයි භික්ෂූන් වහන්සේ තේරුම් ගන්නට අසමත් වීම අනෙක් ප්‍රබල අභියෝගයක් වෙයි.)

තවදුරටත් පරීක්ෂණය කරන්නේ නම් තවත් ප්‍රබල අභියෝගතාවන් දකිය හැකි වනු ඇත. කෙසේ වෙතත් මෙතෙක් සාකච්ඡා කළ තත්ත්වයන් සැළකිල්ලට නොගෙන භික්ෂූන් වහන්සේ ක්‍රියා කරන්නේ නම් ශාසන විනාශයේ වේගය ඉක්මන් වනු නො අනුමාන ය. අද යුගයේ ඇති ප්‍රබලම අභියෝගය වන්නේ සසුනට බාහිරින් එල්ලවන උවදුරු නොව භික්ෂූන් වහන්සේලා මේ තත්ත්වය පොදුවේ තේරුම් නොගෙන ක්‍රියා කිරීමේ අභියෝගයයි.

**පාදක සටහන්**

1. ම.නි. 11, නළකපාන සූත්‍රය, 224 පිට, බු.ජ.
2. අං.නි. 111, පංචධන සූත්‍රය, 82 පිට, බු.ජ.
3. ම.නි. 1, විමංසන සූත්‍රය, 319 පිට, ඍා.

   .. ඉධෙකච්චං ධම්මං ධම්මෙසු නිට්ඨං ගච්ඡති. සත්ථරි පසීදති. සම්මා සම්බුද්ධො භගවා, ස්වාක්ඛාතො භගවතා ධම්මො, සුපටිපන්නො සඞ්ඝො ති"
4. මහාවග්ග 132 පිට, බු.ජ.
5. අං.නි. 111, පංචධන සුත්ත, 82 පිට, බු.ජ.

   "ඉධ භික්ඛවෙ අරියසාවකො පාණාතිපාතා පටිවිරතො හොති - පෙ සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ සීලධනං."
6. අංනි. 111, පඤ්චධන සුත්ත, 82 පිට, බු.ජ.
7. අං.නි. 11, පත්තකම්ම සුත්ත, 124 පිට, බු.ජ.
8. අං.නි. 111, පඤ්චධන සුත්ත, 84 පිට, බු..ජ.
9. එම



10. අං.නි. 111, ඛත්තියරාජ සුත්ත, 248 පිට, බු.ජ.
11. දී.නි. 111, චක්කවත්ති සුත්ත, 102, පිට, බු.ජ.
12. එම
13. සං.නි. 111, පිණ්ඩොල්‍ය සුත්ත, 158 පිට, බු.ජ.
14. මහාවග්ග පාලි. 1, 160 පිට, බු.ජ.
15. අං.නි. 11, දුතිය උරුවෙල සුත්ත, 46 පිට, බු.ජ.
16. L.P.N. Perera: "The Significance of The Sangha for the laity" The Religiousness in Sri Lanka : Ed: by John Rosss Carter, 1978) p:96.
17. එම
18. ජාතක පොත, චුල්ලනාරද ජාතකය, අමරමොලී සංස්කරණය, 1961, 874 පිට.
19. එම

UNIVERSITY LIBRARY



18619